*ISBN 978-955-4563-72-8*

# පුරාණ රෝහණයේ අධ්‍යාපනික පසුබිම

**එච්. කේ. අයි. සෙව්වන්දි**

**පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**

**සංෂේපය**

*පුරාණ ශ්‍රී ලංකාද්වීපය රුහුණු, මායා, පිහිටි යනුවෙන් තුන් රාජ්‍යයෙන් සංගෘහිත වී තිබුණි. එකල එය ත්‍රි සිංහලය නමින් හැඳින්වුණු අතර මේ පිළිබඳව ප්‍රථම වරට කරුණු සඳහන් වන්නේ පොළොන්නරු කාලපරිච්ඡේදයේදීය. ක්‍රිස්තු වර්ෂ 1187-1196 කාල වකවානු වල නිශ්ශංකමල්ල අධිරාජ්‍යයාගේ අභිලේඛන වලින් ද මෙකී තුන් සිංහලය ගැන තොරතුරු සඳහන් වේ. රෝහණයද ඉන් එකකි.[1]එහෙයින් මෙම රෝහනද්වීපයෙහි ආරම්භයේ සිට වත්මන දක්වා වූ ගමන් මග තුළ අධ්‍යාපනය, පසුකර ඇති සංධිස්ථානයන් කෙබඳු වී ද යන්න විමසා බැලීම මෙහිදී සිදු කර ඇත.*

## හැඳින්වීම

අධ්‍යාපනය සඳහා නියමිත කාලයක්, වයසක් හෝ භේදයක් නැත. තමන් ලද ජීවිතය තුල විධිමත් හා අවිධිමත් ලෙස අධ්‍යාපනය ලැබිය හැකිය.

"Bring out or develop from latent or potential existence, elicit"[2]

Concise Oxford Dictionary ට අනුව අධ්‍යාපනය යන්න අර්ථ දක්වා ඇත්තේ නෛසර්ගික ශක්තීන් මතුකර පිටතට නැගීම, මතුකර දීම හා භාවිතය මගින් වර්ධනය යන අදහස ඇතිවය. අධ්‍යාපනය යනු අවිද්‍යාවෙන් විද්‍යාව කරා යෑමකි. යමෙකු තුල ඇති හැකියාවන්, කුසලතාවයන්, නිර්මාණශීලී චින්තනයන් දියුණු කර ගැනීමට සහාය වීම අධ්‍යාපනයේ ඵලදායිතාවය ලෙස නම් කළ හැකිය.

## මුල් යුගයේ අධ්‍යාපන සංවර්ධනය

අධ්‍යාපනය ගැන අවධානය යොමු කරන කල්හි මාතර දිස්ත්‍රික්කයේ ද පුරාණ කළ සිටම යම් කිසි ආකාර වූ අධ්‍යාපන ක්‍රමයක් පැවති බව අවබෝධ කරගත හැකිය. ප්‍රාග් බෞද්ධ යුගයේ භාරතීය සමාජයේ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන චතුර්වර්ණයෙන් ආරම්භ වූ කුල ශ්‍රේණි ක්‍රමයක් මෙම දිස්ත්‍රික්කය තුල ද පැවති බව අනුමාන කළ හැකිය. රටේ සංවර්ධනයට නැතහොත් පැවැත්මට උරදෙන්නාවූ නේක විධ කර්මාන්ත සඳහා දායකත්වය ලබා දුන් පුද්ගලයන් තමන් කරන ලද රැකියාවට අනුව නැතහොත් කරන ලද ශිල්පයට අනුව හඳුන්වනු ලබන ශ්‍රේණි ක්‍රමයක් පුරාණ මාතර පැවති බවට සාක්ෂි ඇත.

වළං සෑදීම, රන්රිදී කර්මාන්තය, පිළිම නෙළීම, රෙදි සේදීම, කොණ්ඩා කැපීම, වඩු කර්මාන්තය, චිත්‍ර ඇඳීම[3] ආදී වෘත්තීන් වල නියැලුණු පුද්ගලයන් ඒ ඒ ශ්‍රේණි වලට අයත් විය. මෙම වෘත්තීන් ආකස්මිකව පහළ වූවාක් නොවේ. එය පරම්පරානුගතිකව ක්‍රමයෙන් විකාශ වූවාක් ලෙස දැක්විය හැකිය. තමාගේ කුලය නැතහොත් ශ්‍රේණිය අවිච්ජින්නව පවත්වා ගැනීම සඳහා වැඩිමහල් පරම්පරාව විසින් තම බාල පරම්පරාවට මෙය පැවරීහ. එකල් හි යම් කිසි විධිමත් ආයතන මගින් මේවා පුරුදු පුහුණු කළ බව සිතිය නොහැකිය. ඒ සඳහා නිශ්චිත වශයෙන් වෙන් වූ ස්ථානයක් තිබෙන්නට ඇතැයි ද අනුමාන කිරීමට නොහැකිය. යම් කිසි අවස්ථාවක ඒ සඳහා තම නිවස මූලික කරගෙන මෙම අධ්‍යාපනය ලබාදෙන්නට ඇත. තම දරුවන්ට හෝ තම සගයන්ට නොවිධිමත් රටාවකට තම ගෘහයන් තුලදී ම මෙම වෘත්තීය අධ්‍යාපනය එකල ලබාදෙන්නට ඇත. මෙකී අධ්‍යාපනය පාදක කරගෙන ගොඩ නැගුණා වූ වෘත්තීන් අද ද මාතර දිස්ත්‍රික්කයේ ගම් නියම් ගම් තුල දැකිය හැකිය. අතීතයේ පටන් ම පැවති තම වෘත්තීය ශිල්ප නොනැසී යාමට ඉඩනොදී එය පරම්පරානුගතව වත්මන දක්වා ආ සංවර්ධනීය ගමන් මග එකල පැවති අධ්‍යාපනයේ ඵලදායිතාවය ලෙස අපට හඳුනාගත හැක.

*ISBN 978-955-4563-72-8*

**අෂ්ට මූලස්ථාන මගින් අධ්‍යාපනය ලබාදීම**

ආරාමික අධ්‍යාපන මධ්‍යස්ථාන වල දියුණුම අවස්ථාවක් ලෙස මූලායතන හැඳින්විය හැකිය. අනුරාධපුර කාලපරිච්ඡේදයේ සිටම පැවතියා වූ මෙම මධ්‍යස්ථාන වල වර්ධනීයත්වය දැකගත හැකි වනුයේ පොළොන්නරු යුගයේදීය. ක්‍රි. ව. 1110- 1132 කාලපරිච්ඡේදය තුළ රජ පැමිණි පළමුවන වික්‍රමබාහු රජතුමා විහාර දේපළ රාජසන්තක කිරිමේ පිළිවෙතක් ක්‍රියාත්මක කළ අතර මෙම මූළ නමින් හැඳින්වූ සංස්ථාවල භික්ෂූන් එයට විරුද්ධත්වය ප්‍රකාශ කිරිමෙහිලා දළදාව සහ පාත්‍රාව රැගෙන රෝහණයට පළා ගොස් ඇත. මෙම මූලායතනයන්හි දියුණුව පිණිස ක්‍රියාකළ රජවරුන් අතර පළමුවන පරාක්‍රමබාහු රජතුමාට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. එම අෂ්ට මූලායතන මෙසේය.

01) දක්ඛිණ මූලය

02) උත්තරෝළ මූලය

03) මහානෙත්ත පාසදමූලය

04) සේලාන්තර මූලය (ගලතුරු මූලය)

05) කප්පර මූලය

06) සේනපති රාජ මූලව

07) වහාදීපක මූලය

08) විල්ගම්මුලය

මෙම මූලායතන කේන්ද්‍ර කරගනිමින් එකල අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදු වී ඇත. පොළොන්නරු යුගයේ ආරම්භයේ සිටම උත්තරෝළ මූලයට (උතුරු මූලය) හිමිව ඇත්තේ ප්‍රධාන ස්ථානයකි. එහිදි දළදා වහන්සේගේ ආරක්ෂාව පිළිබඳ අයිතිය පැවරි තිබුනේ මෙම උතුරු මූලයටයි. වළගම්බා රාජ්‍ය පාලන කාලය තුළ ඔහුගේ ඇමතියෙකු වූ උත්ථිය විසින් අනුරාධපුර යුගයේ දකුණු පෙදෙසේ දක්ඛිණ නමින් විහාරයක් කරවූ බවත් මෙම විහාරස්ථානය මූලික කරගෙන දක්ඛිණ මූලය ආරම්භ[4] වූ බවටත් සාක්ෂි ඇත. එසේම මෙවැනි ආකාරයෙන්ම අන් මූලායතන වලටද අධ්‍යාපන කාර්යයන් සාර්ථක ලෙස කරගෙන ගොස් ඇති බවට සාක්ෂි ඇත. එහිදි මෙම අධ්‍යාපනයේ මූලස්ථානය දරමින් එම සත් කාර්යය කිරිමෙහිලා පුරෝගාමී වූවෝ භික්ෂූන් වෙති. මාතර දිස්ත්‍රික්කයේ මුල් යුගයේ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනයේදී මූලායතනයන්ට ලැබෙනුයේ සුවිශේෂි ස්ථානයකි. මෙම මූලස්ථාන අටෙන් මූලායතන දෙකක්ම රුහුණේ [5] පිහිටි බවට තොරතුරු ඇත. මෙම මූලායතන දෙක කේන්ද්‍රකර ගනිමින් අතීත රුහුණෙහි අධ්‍යාපන සංවර්ධනයක් ඇති වී තිබුණු බව පැහැදිලිය. ගලතුරුමූල සඟගණයට ආවාසයක් ලෙස ගලතුරුමූලපාය නමින් තිභූමික සංඝාරාමයක් ක්‍රි.ව. 1036 දී රාජ්‍යප්‍රාප්ත මහාවිජයබාහු රජුගේ ලීලාවතී නම් බිසව විසින් කරවූ බව [6] මහාවංශයේ සඳහන් වේ. පරෙවි සන්දේශකරුවා ගලතුරුමූල සංඝාවාසය පිළිබඳව මෙසේ දක්වා ඇත.

" සලතුරු ටැඩින් සුලකල තුන් මහල් යෙදූ

නිලතුරු කිකිණි බඳ රන් දද පෙළ සුසැදූ

දුලතුරු වැලෙව් පලගෙයි මුතුලැල් සිනිඳු

ගලතුරු මූල පායෙහි මහ සඟන වඳු "

ලංකා ඉතිහාසයේ ඉතා ප්‍රකට අෂ්ට මූලායතන අතුරෙන් දෙව්නුවර සඟගණය, සෙල්ලන්තරමූලය, ගලතුරුමූලායතනය යන නමින් ප්‍රකට විය. දඨෝපතිස්ස රජු දවස පැවිදිව සිටි එම රජුගේ මුණුබුරු ආරණ්‍යක භික්ෂූන් වහන්සේ නමක් මේ විහාරස්ථානයෙහි වාසය කරවීමෙන් පසු සෙල්ලන්තරායතනය ආරම්භ වූ බව මහාවංශයේ විස්තර කර ඇත. මහා විජයබාහු රාජදේවිය හා ලෝකේශ්වර බිසව යන බිසෝවරු දෙවරක් ගලතුරුමූලපාය ප්‍රතිසංස්කරණය [7] කරවූ බව චූලවංශය සඳහන් කරයි.

***ISBN 978-955-4563-72-8***

මෙසේ දක්ඛිණයෙහි පැවතියාවූ ගලතුරුමූලය එවකට ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානයක් විය. පළමුවෙනි පරාක්‍රමබාහු රජු අවධියේදී මෙම මූලායතනය මගින් ඉතා දියුණු ලෙස අධ්‍යාපන කර්තව්‍යයන් කළ බව පැහැදිලි වේ. පොළොන්නරු කාලපරිච්ඡේදය වන විට විල්ගම්මූල ආයතනයද අධ්‍යාපනයේ ප්‍රධාන මධ්‍යස්ථානයක්ව පැවති බවට සාක්ෂි ඇත. මෙම විල්ගම්මූල නාමය පිළිබඳ නේකවිධ ගැටලුන් ඇත. ඒ අතරින් මෙම අධ්‍යාපන මධ්‍යස්ථානය රුහුණේ පැවති බවටද සාක්ෂි ඇත. ඒ අනුව මෙම විල්ගම්මූල පැවතියේ බිබිල- ගල්ඔය පාරේ පිටකුඹුර නැමති ග්‍රාමයේ බව විමලකීර්ති හිමියන්[8] දක්වා ඇත. කෙසේ වෙතත් මෙම මූලායතන කේන්ද්‍ර කරගනිමින් එකල අධ්‍යාපන කටයුතු සිදුවුණු බවට කරුණු පැහැදිලිය.

**බෞද්ධ සමාජය මගින් අධ්‍යාපනය දියුණු වූ ආකාරය**

පුරාණයේ තැනින් තැන පැවති අසංවිධිත ගුරු ගෙදර අධ්‍යාපන සම්ප්‍රදාය ක්‍රමයෙන් බිඳ වැටී සංවිධිත බෞද්ධ ආයතන ක්‍රමයක් දේශය පුරාම ගොඩනැගෙන්නට බිහි වූ ප්‍රධානම පදනම වූයේ මහින්දාගමනයයි. මූලික වශයෙන් බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය බිහි වූයේ පන්සල් ආශ්‍රිතවය. එසේ ආරම්භ වූ අධ්‍යාපනයේ භාරකරුවන් වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාය. ධර්මය කටපාඩම් කර දරා ගැනීම හා ඒ තුල අඩංගු සාරධර්මයන් හා ශික්ෂනයන්ට අනුකූලව මහජනයා හැඩගස්වාලීමේ වගකීම ද පැවරුනේ මේ සඟ පිරිසටයි. තමන් දත් දෙය විහාරස්ථානය කරා පැමිණෙන ජනතාවට කියා දුන්හ. ජනතාව ද තමන් නොදන්නා දේ අසා දැනගත්තේ භික්ෂූන් වහන්සේලාගෙන්ය. ගිහියන් විසින් සකසා දුන් කුඩා කුටි වල වාසය කරමින් තමන් දත් දෙය ඔවුන්ට කියාදෙමින්, බුදු දහම උගන්වමින්, ගුරුගෝල සම්බන්ධතාවයෙන් යුතුව එකිනෙකා ක්‍රියා කළහ. මෙසේ නිර්මාණය වූ කුටි පසුව වර්ධනය වී භික්ෂු වාසස්ථාන වන පිරිවෙන් ලෙසින් නම් විය. වත්මන වන විට භික්ෂූන් අධ්‍යාපනය ලබන ආයතන ' පිරිවෙන් '[9] ලෙස හැඳින්වේ. මුල් කාලයේ දී පිරිවෙන් යන නමින් හැඳින්වූයේ භික්ෂූන්ගේ වාසස්ථානයයි. ' පිරිවෙන් ' යන වදන පාලි ' පරිවේණ ' යන්නෙන් බිඳී ආවකි. පරිවේණ යන්නෙහි අර්ථය වනුයේ හාත්පසින් සීමා කළ, වෙන් කළ කොටසයි. වංශකථාකරුවෝ ඇතැම් තැනෙක මේ සඳහා පරිච්ඡේද[10] යන්නත් යොදා ගෙන ඇත. ජාතක පොතේ බුදුන් වහන්සේ වැඩ විසූ කුටිය හඳුන්වා ඇත්තේ "ගඳකිළි පිරිවෙන" ලෙසයි. පොළොන්නරු හා කෝට්ටේ යන යුගයන්හි ද විද්‍යාස්ථානය හැඟවීම සඳහා පිරිවෙන යන්න භාවිතා කර ඇත. එහෙත් පසුකාලයේ දී බහුශ්‍රැත මහතෙරුන් විසූ තනි තනි වූ හෝ අල්ප සංඛ්‍යාවක් වූ සිසුනට ඉගැන්වීම සඳහාත් යොදා ගැනීම නිසා කල්යෑමේදී භික්ෂූන් උගන්වන ස්ථානය "පිරිවෙන" යන්න භාවිතා කිරීමට[11] පෙළඹී ඇති බව පැහැදිලිය. පළමුව භික්ෂූන් වහන්සේලාට ඉගැන්වීම සඳහා භාවිත කල පිරිවෙන කල් යත්ම ගිහියන් සඳහා ද විවෘත විය.

මාතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේදී ගමේ තිබූ පන්සල මූලික අධ්‍යාපන ආයතනය වූ බවත්, පිරිවෙන ද්විතීය අධ්‍යාපන ආයතනය වශයෙන් සැලකූ බවත් පෙනේ. මෙම ඉගැන්වීම් සම්ප්‍රදායේදී විවිධ ඉගැනුම් ක්‍රම භාවිතා කර ඇත. ඒ සඳහා ගැටලු විසඳුම් ක්‍රමය, කතාන්දර ක්‍රමය, දේශනා ක්‍රමය, සාකච්ජා ක්‍රමය, වාද විවාද ක්‍රමය ප්‍රධාන වශයෙන් භාවිතා කර ඇත. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධාන කාර්ය වූයේ දැනුමෙන් පමණක් නොව ගුණයෙන් ද පෝෂණය වූ ජන සමාජයක් බිහිකිරීමයි. එහෙයින් මාතර දිස්ත්‍රික්කයේ සෑම පන්සලක්ම පැරණි අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස කේන්ද්‍රගත විය. මාතර දිස්ත්‍රික්කයේ ද ප්‍රසිද්ධ පිරිවෙන් රාශියක් ඇත. ඒ අතර මහා මනිතීන්ද්‍ර පිරිවෙන, කිතුලේවෙල ජයමහා විහාර පිරිවෙන, මිගදාය පිරිවෙන, සිරි සුදස්සි පිරිවෙන ප්‍රධාන වේ.

**අධ්‍යාපනයේ පරිහානී සමය.**

ක්‍රි. ව. 1505 දී පෘගුගීසීහු ගාලු වරායෙන් ලංකාවට ගොඩබට බව ඉතිහාසයේ සඳහන් වේ. එසේ ගොඩබට පරංගි හමුදා සහ මංකොල්ලකරුවෝ දකුණේ මුහුදු බඩ ප්‍රදේශ මංකොල්ල කෑමට වූහ. දකුණේ මුහුදු බඩ ප්‍රදේශ වල ජීවත් වූ නාගගෝත්‍රික ආර්ය සිංහල ජාතිකයන්ට අනාර්ය වූ දුසිරිත් අනුගමනය කළ පරංගි ජාතිකයන්ගෙන් සිදුවන හිරිහැර නොඉවසිය හැකි වූහ. එබැවින් සිංහලයෝ ගම්බිම් අත්හැර රට මැදට සංක්‍රමණය වීම නිසා මේතාක් ජනාවාසව පැවති දකුණේ මුහුදු බඩ ප්‍රදේශ ජනශුන්‍ය භාවයට පත්වන්නට විය. එම දුර්භාග්‍ය සම්පන්න ඉරණමට දකුණේ වෙහෙර විහාර ලක් වීම කණගාටුදායකය. කෝට්ටේ පාලකයාව සිටි ධර්මපාල රජු ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීමත් සමග එවකට මාතර දිසාපති ධූරය දැරූ කෘතහස්ත යුද්ධ සේනාධිපතියකු වූ මාතර උපන් සමරකෝන් රාලද ක්‍රිස්තු භක්තිකයකු[12] විය. එය මාතර බෞද්ධ බලයට තදබල පහරක් විය. එබැවින් පෘතුගීසී

***ISBN 978-955-4563-72-8***

වැලිගම අග්‍රබෝධි විහාරය ද කඩා දෙවිනුවර දේවාලය ද විනාශ කළේය. මෙසේ දෙවිනුවර දේවාලය විනාශ කිරීමට පැමිණි අවස්ථාවේ එහි චණ්ඩමාරුතයක් ඇති වූ බව ජනප්‍රවාදයේ කියැවේ. දේව නගරයේ පිහිටි තුන්තමල් රන් උළු සෙවෙනි කළ දේව මන්දිරය හිරු එළියෙන් දිලිසෙමින් මුහුදට දිස්වීම නිසා මෙහි පැමිණි පරංගි මංකොල්ලකරුවෝ දේව මන්දිරයේ තිබූ  සියලු වටිනාදේ පැහැර ගනිමින් මංකොල්ල කෑහ. ඒ අතර මැටියෙන්, ලීයෙන් හා තඹවලින් කරන ලද දේවරූප ද , පිළිම ද, බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව ඇති සියලු වටිනා ග්‍රන්ථ ද විනාශ කළේය. එවිතරකුදු නොව ග්‍රන්ථයන් එක් රැස් කර තිබූ ස්ථාන පවා ගිනි බත් කළහ.

1588 දී මාතර දිසාව පාලනය කළ මනම්පේරී මුදියන්සේගේ පාලනයට විරුද්ධව මාතර ජනයා කැරලි ගැසූහ. කිරිවැල්ලේ රාලහාමි, දන්තුරේරාල හා ඒකනායක මුදලි විසින් මෙහෙයවනු ලැබූ සිංහල සේනා දෙණිපිටියේ දී පෘතුගීසී සේනා සමග ගැටුණහ. එහෙත් කල්යත්ම නැවතත්  මාතර පෘතුගීසීනට යටත් වූ අතර මෙම ප්‍රදේශයේ ඇති සියලුම වටිනා වස්තූන් කොල්ලකෑහ. බෞද්ධ මධ්‍යස්ථානයන් විනාශ කළහ. මෙසේ විහාරස්ථාන විනාශ කිරීමේ දී ඒ හා සමග පැවතියා වූ පොත්ගුල් ද විනාශ වන්නට ඇත. එහෙයින් අධ්‍යාපන කේන්ද්‍රස්ථාන ලෙස ස්ථාපිත වී තිබූ වෙහෙර, විහාරස්ථාන සහ පිරිවෙන් ආදිය විනාශ වූහ.

**සරණංකර හිමියන්ගෙන් ඇති වූ ශාස්ත්‍රීය ප්‍රබෝධය**

ශ්‍රී සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාත් සිංහල සභ්‍යත්වය ආරක්ෂා කිරීම සඳහාත්  සඟරජ හිමියන්ගෙන් සිදු වූ සේවය අපිරිමිතය. සිංහල භාෂාව හා සාහිත්‍ය ක්‍රමයෙන් අප අතරින් ගිලිහෙද්දී එය නගා සිටුවීමට උන්වහන්සේ නොගත් වෙහෙසක් නැත. විදේශීය ආක්‍රමණ හා මෙරට රාජ්‍ය පිරිහීම තුල අප සතු පැරණි පොත පත  රැකගැනීම සඳහා එ හිමියන්ගෙන් සිදු වූ සේවය අතිශ්‍රේෂ්ඨය. තමන් දත් දෙය ගුරුමුෂ්ටියකින් තොරව ලෝවැසියාගේ හිත සුව පිණිස යෙද වූ අතර එය පවත්වා ගැනීම සඳහා ගෝල පරම්පරාවක් ද බිහි කළේය. 18 වන සියවසේ දී උඩරට හා පහත රට ආරම්භ වූ පන්සල් කේන්ද්‍රකරගත් අධයාපනයෙහි ආදී කතුවරයා වනුයේ සරණංකර හිමියන්ය. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමය කොටස් 4 ක් යටතේ ක්‍රියාත්මක විය.

1) අකුරු නොදත්තෝ
2) සිලිවාරම් අකුරු දත්තෝ
3) පොත පත කියවීමට තරමක් හුරු පුරුදු වූවෝ
4) පොත පත ඉගෙන උපසම්පදාවට හැඩගැසෙන්නෝ[13]

යනුවෙනි.

සරණංකර හිමියන් සැබෑ ගුරුතුමෙක් විය. ඒ කෙසේ ද යත්, පොත පතේ අඩංගු කරුණු වලට පමණක් සීමා නොවී  තම සගයන්ට වඩාත් හොඳින් අරුත් වැටහීම සඳහා විවිධාකාරයේ නිදසුන් භාවිතා කර ඇත.

"නාම තුන් ලිගුව ට
වරනගා තුබූ පෙර සිට
සඳ වරනැගිල්ල ට
උදාහරණයක් යොදා එක්කොට "

"රූප මාලා ය න
නමකුත් ඊට තබමි න
නැණ නෙත් පහදව න
පොතක් කැර ලා පෙළට වැඩවන "[14]

තමන් වහන්සේ යම් කිසි ග්‍රන්ථයකින් උගත් දෑ තම ශිෂ්‍ය පරම්පරාවට දායාද කිරීමේ දී ඔවුන්ගේ පරිසය, ඔවුන්ගේ වයස, ඉගනීම ආදිය පිළිබඳව අවධානය යොමු කොට ඊට සරිලන පරිදි නිදර්ශන භාවිතා කිරීමට උන්වහන්සේ පෙළඹුණේ  උගන්වන දෙය පිළිබඳ මනා අවබෝධයක් තම ගෝල පරම්පරාවට ලබා දීම සඳහාය.

*ISBN 978-955-4563-72-8*

එසේම ලෙවුකේ රාළහාමිගෙන් බාලාවතාර නාම කාණ්ඩය උගෙන එය සිටිනාමලුවේ හා ඉලිපැන්ගමුවේ දෙනමටත් ඉගැන්වීමට මෙහිමියන් ක්‍රියා කළේය. එයින් පැහැදිලි වනුයේ තමන් ඉගෙන ගත් දෑ තවත් අයෙකුට ඉගැන්වීමෙන් තම ගෝල පරම්පරාව විහිදුවාලීමට තිබූ හැකියාවයි. තවද ශිෂ්‍ය පරම්පරාව වර්ධනය වත්ම උන්වහන්සේ කටයුතු කළ ආකාරය හේවාවසම් දක්වා ඇත්තේ මෙසේය.

" ශිෂ්‍ය ගණන වැඩිවත් ම නරේන්ද්‍රසිංහ රජු ලවා උඩු නුවර ඇම්බැක්කේ දේවාලයට නුදුරු වූ ඡායුදක සම්පන්න, තපො ජන මනෝනන්දනීය සුන්දරතර නියමකන්ද යන වන ප්‍රදේශයෙහි විශාල ශාලා ගෘහ පන්ත්‍යාදීන් සමුපශොභිත කොට කරවන ලද අරාමයෙහි විවේකයෙන් සිය ඉගැන්වීම් කරගෙන ගිය අප හිමිපාණෝ රෑ දවල් දෙකෙහි අප්‍රමාදව ලීම්, කීම්, ශබ්ද ශාස්ත්‍රාදී බණ දහම් බොහෝ ශිෂය ගණයාට පුරුදු කරවීමෙන් අභිනව ගාථා අෂ්ටකාදී ප්‍රබන්ධ කිරීමට ද සමර්ථ කරවමින් තමන් වහන්සේ ද බොහෝ පොත් ලියූහ. සිය ගුරුතුමා ආදර්ශයට ගත් සිසුවරු බොහෝ දෙනෙක් ශබ්ද ශාස්ත්‍ර ඉගැන්වීමේ හා ග්‍රන්ථකරණයේ යෙදුණෝය. "[15]

සරණංකර මාහියන් වත්මනේදිත් ජනතාවගේ ගෞරවාදරයට වඩා පාත්‍ර වනුයේ එතුමන්ගෙන් වූ ශාස්ත්‍රීය සේවාව නිසාය. මෙතුමන් විසින් එවකට අභාවයට ගිය සිංහල පොත් බොහෝ ගණනක් සොයා නැවත පුස්කොළ වල ලියවා ප්‍රචාරය කරන ලදි. එසේ ලියවා ප්‍රචාරය කරන ලද පොත්පත් ආරක්ෂා කරලීම සඳහා විහාරස්ථාන වල පොත්ගුල් නිර්මාණය කළේය. එපමණක් නොව සරණංකර මාහිමියන් විසින් ලියන ලද පොත් ද බොහෝ ගණනකි. සාරාර්ථ සංග්‍රහය, මධුරාර්ථ ප්‍රකාශිනි නම් පාලි මහා බෝධිවංස සන්නය, භෙසජ්ජමංජුසි අර්ථ වර්ණනාව, සාරාර්ථ දීපනී නම් සතර බණවර සන්නය, අභිසම්බෝධි අලංකාරය, රූපමාලාවහා මුනිගුණ අලංකාරය [16] මෙතුමන් අතින් ලියැවුණු ග්‍රන්ථයෝය.

**සඟරජුගේ මාතර ශිෂ්‍ය පරම්පරාවෙන් අධ්‍යාපනයට සිදු වූ සේවය**

වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් විසින් ඉතා වෙසෙසින් ඇති කරන ලද භාෂා සාහිත්‍ය පුනරුත්තාපනය එතුමන්ගේ අභාවයත් සමග ම අභාවයට යා නොදී ඉදිරියට ගෙන යැමෙහි එතුමන්ගේ ශිෂ්‍යයානු ශිෂ්‍යයන් සමත් වූ බව පැහැදිලිය. ඒ බව හේවාවසම් දක්වා ඇත්තේ පහත ආකාරයෙනි. "සරණංකර සංඝරාජයන් වහන්සේ නරේන්ද්‍රසිංහ මහීපාලයන් රෝපණය කළ ධර්ම ශාස්ත්‍ර බීජය තමන්වහන්සේගේ අප්‍රතිහත ධෛර්ය නමැති ජලය වක් කරනු ලැබීමෙන් හා සිය භක්තිමත් ශිෂය ගණයාගේ සහායත්වය නැමති පොහොර කිරීමෙන් වැඩි, නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජය රාජසිංහ හා කීර්ති ශ්‍රී රාජසිංහ යන නරවීරයන්ගේ අනුග්‍රහය නමැති ආරක්ෂාව සැලසීමෙන් මල්පලෙන් ගැවසී ශාඛා, ප්‍රශාඛා දසත විහිදී ගොස් අතිශයින් ශෝභමාන වී ඒ මහගු පල රුක කරගනිමින් එයින්ම පෝෂණය ලද්දන් අතුරෙන් මහත් කීර්තියට පැමිණියෝ මාතර පුත්‍රයෝය. ඔහු ඒ අගනා පල නෙලා තුලාධාර පබ්බත, ගලතුරුමුල, විජයබා ආදී ශ්‍රේෂ්ඨ විද්‍යායතනයන් නිසා ඈත අතීතයේ සිට අධ්‍යාපනය සම්බන්ධයෙන් අති ප්‍රසිද්ධියට පැමිණි රුහුණු රට මාතර ප්‍රදේශයට ගෙන ගොස් කහඳාව, මුකිරිගල, කහගල, කළුගල, වේරගම්පිට, පෙතංගවත්ත ආදී නොයෙක් තැන්හි රෝපණය කොට ඉතා ආදරයෙන් හා උනන්දුවෙන් රැකබලා ගත්හ. වැඩි කලක් ගත වන්නට පෙර ඒවා වැඩී, ඒවායේ පල පාත රැට සෑම තැනටම බෙදී ගියේය."[17]

වැලිවිට සරණංකර හිමියන් විසින් දල්වන ලද ශාස්ත්‍රාලෝකය උඩරටින් මාතර පෙදෙසට ගෙනයාමෙහි පුරෝගාමීන් වූවේ සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්ය. සිටිනාමළුව දකුණු පළාතේ බටහිර ගිරුවාපත්වේ ගමකි. සිටිනාමළුවේ උපත ලද හෙයින් සිටිනාමළුවේ සාමියැයි ප්‍රසිද්ධියට පත් මෙහිමියෝ වැලිවිට සරණංකර මාහිමියන් සමගම ශාස්ත්‍රය ඉගෙනීමෙ හි නිරත වී එතුමන්ගෙන් ද බොහෝ දේ දැන ඉගෙනීමෙන් සරණංකර හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යයා ලෙස ප්‍රසිද්ධයට පැමිණ, සරණංකර හිමියන් නුවර මලවතු විහාරයේ වැඩ වසද්දී අස්ගිරි වෙහෙරේ වැඩ වසමින් ශාස්ත්‍රය පතුරුවා ලීමෙහි වෙහෙසුණහ. බාලාවතාර සංග්‍රහය මෙතුමන් අතින් ලියැවුණු ග්‍රන්ථයකි.[18] මීටඅමතරව වෙහැල්ලේ ධම්මදින්න, කඳුරුපොකුණේ සුවණ්ණජෝති හා දික්වැල්ලේ බුද්ධරක්ඛිත යන පැවිදි උතුමෝ ද බරණ නම් ගණිතාචාර්යයවරයා හා පත්තායමේ ලේකම් නම් කවියාට ද හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. [19]

වෙහැල්ලේ ධම්මදින්න හිමියන් සිය ඇදුරුතුමාගෙන් මූලික අධ්‍යාපනය ලබා වැඩි දුර ඉගනීම සඳහා සඟරජ හිමියන් කරා ගියේය. උන්වහන්සේ ධර්මය දේශනා කිරීමේ දී සඟරජු පමණක් මතු නොව කිස්තිරි රජු පවා පහදවා ගැනීමට සමත් විය. කඳුරු පොකුණේ සුවණ්ණජෝති හිමියන් මාතර වේරගම්පිට විහාරයේ වැඩ විසූ හිමි නමකි. උන්වහන්සේ සිටිනාමළුවේ හිමියන්ගේ ඇදුරිඳු ද විය.

*ISBN 978-955-4563-72-8*

දික්වැල්ලේ දීසවාලුකාරාමය පිහිටු වීමේ ආදිකර්තෘවරයා ලෙස හැඳින්වෙන දික්වැල්ලේ බුද්ධරක්ඛිත තෙරණුවන් ද මේ අතර ප්‍රසිද්ධය. සුතසෝම ජාතකය වස්තු විෂය කොටගෙන රචිත "කාව්‍ය දීපනී" නම් කෘතිය මෙම ස්වාමීන් වහන්සේගේ කෘතියකි.[20] මෙසේ නොයෙකුත් ආකාරයෙන් ශාස්ත්‍ර උන්නතිය දියුණු කිරීම සඳහා කාප වී සේවය කළේය.

සිටිනාමළුවේ හිමියන්ගේ ශිෂ්‍යයන් අතර සිටි ශිෂ්‍යයෙක් ලෙස බරණ නම් නැකතියා හැඳින්විය හැකිය. මොහුද සිටිනාමළුවේම උපන් පුද්ගලයෙක් වූ අතර එහිමියන්ගේ ඇබිත්තයා ලෙස කටයුතු කළේ ද මොහුය. බරණයන් පිළිබඳ නොයෙතුක් පුරාවෘත්ත ජනප්‍රවාදයේ ඇති අතර හේවාවසම් ඒ බව දක්වන්නේ මෙසේය.

" සිය ඉගනීම නිම කළ සිටිනාමළුවේ හිමියෝ ගමරට බලා යෑමට පෙරාතුව කිත්සිරි රජු හමුවීමට සිය අතවැසියා සමග මහවාසලට ගියහ. බරණයන් එකල හැඳින්වූයේ සාදා නමිනි. රජතුමා ඔහු ගැන විපරම් කළේය. ඔහු ගණිත කොලුවකු බවත්, නක්ෂත්‍රය සම්බන්ධයෙන් මනා දැනුමක් ඇත්තකු බවත් ගුරු හිමියන් ප්‍රකාශ කළ විට එදින රිට්ටාව වූ තැන කියන ලෙස රජතුමා ඔහුට අණ කළේය. තම දැනුම මනාව ප්‍රකාශ කරලීමට අවස්ථාවක් දුටු සාදා, සමාවන්න දේවයන් වහන්ස, මට සතර රියන් රිටක් ලැබෙන සේක්වා යි කීය. ඔහුට රිටක් ලැබිණි. එහි එක් කොනක පුලුන් රොදක් රුඳ වූ හෙතෙම, මිදුලට බැස රිට අහසට දිගුකළේය. පුලුන් රොද උඩට සිටින සේ. සැණෙකින් පුලුන් ගිනිගෙන දා හලු විය. ඉන් විස්මයට හා ප්‍රීතියට පත් නරවීරයෝ ඔහුට බොහෝ තෑගි බෝග දී, චන්ද්‍රාභරණ යන උපාධිය ද පිරිනැමීය."[21] මොහු තව ද වඩා ප්‍රසිද්ධියට පත් වූයේ නීලකොබෝ සන්දේශය[22] රචනා කිරීමෙනි. මෙම සන්දේශය බරණයන් විසින් රචනා කරන ලද්දේ තම සිරුරෙහි හටගත් වාත රෝගයක් සුවකර දෙනු වස් කතරගම දෙවියන් හට කන්නලව් කිරීම සඳහාය. මෙසේ නේක විධ ග්‍රන්ථයන් රචනා කරමින් ඒවා පොත්ගුල් වල තැන්පත් කළේය.
සිටිනාමළුවේ හිමියන් යටතේ අධ්‍යාපනය ලැබූ තවත් ශිෂ්‍යයෙක් ලෙස පත්තායමේ ලේකම් හැඳින්විය හැකිය. මොහු බරණයන්ගේ මිතුරෙකු විය. බරණයන් අග හිඟ කම් වලින් පෙළුණු පුද්ගලයෙකි. මේ තතු සියල්ල දත් පත්තායමේ ලේකම් ගණිතැදුරන්ගේ බිරිඳ සමග අයතා සම්බන්ධයක් ඇති කර ගත් බව සඳහන් වේ. එක් රැයක් පත්තායමේ ලේකම් බරණ බිරිඳ සොයා ගියේ ඒ රාත්‍රියේ බරණයන් ගෙදර නුවූ බවට ලැබුණු ආරංචියකිනි. එහෙත් බරණ නිවසේ සිටියේය. පත්තායමේ ගෙන් පිට සිට තමා ආ බව සලකුණක් කළ පසු සිය සැමියා ගෙයි වූ බව සැල කරනු පිණිස බරණ බිරිය තම දරුවා නලවන ව්‍යාජයෙන් මෙසේ කීය.

"යකඩ මහා විත් මෙගෙයි සිටින්නේ
සරසර ගා කුමටද සොල වන්නේ
තුමුන් නසාලා මාත් නසන්නේ
දෙන්නම නොනසිති නාවෝති න්නේ "[23]

තතු මෙසේ වුව ද සිටිනාමළුවේ හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යයකු වූ පත්තායමේ ලේකම් විසින් රචිත කෘතියක් ලෙස වියොවගරත්න මාලය හැඳින්විය හැකිය.

## නිගමනය

කරතොට හිමියන්ගේ පැවිදි ශිෂ්‍යයන් අතර කදුරුපොකුණේ සෝහිත, කදුරුපොකුණේ සුවණ්ණජෝති, පුංචි කරතොට, වලගෙදර ධම්මදස්සි, හෙට්ටිගොඩ සුමංගල, ඇලපාත, අක්මීමන ආදිවිශාල පිරිසක් වූහ. තවද නොයෙකුත් ආකාරයෙන් මෙම සංඝ පරම්පරාව මාතර දිස්ත්‍රික්කය පුරාම පැතිර එවකට මාතර සාහිත්‍ය පුනර්ජීවයක් ඇති කළ බවට සාධක ඇත. උන්වහන්සේලා විසින් රචිත පොත පතින් ද හෙළිවනුයේ එකල පැවති සාහිත්යික වර්ධනයයි. මෙසේ රෝහණදීපයෙහි මූලාරම්භයේ සිටම ක්‍රියාත්මක වූ අධ්‍යාපන තත්ත්වය පිළිබඳ කරුණු පැහැදිලි කර ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, **මාතර වංශය**, 2008, කොළඹ.
සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, **මාතර වංශය**, 2008, කොළඹ.
සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, **මාතර වංශය**, 2008, කොළඹ.

***ISBN 978-955-4563-72-8***

මහාවංශය (1995), පරිවර්තනය, ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත බටුවන්තුඩාවේ, කොළඹ, ගොඩගේ
**මාතර සාහිත්‍ය යුගය** (1953), විමලකීර්ති හිමි, මැද උයන්ගොඩ, පැලියගොඩ, බෞද්ධ පොත් සමාගම.
**මහාවංශය** (1995), පරිවර්තනය, ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත බටුවන්තුඩාවේ, කොළඹ, ගොඩගේ
**චූලවංශය** (1936), සංස්කරණය, සුමංගල සහ බටුවන්තුඩුවාවේ, කොළඹ.
**මාතර සාහිත්‍ය යුගය** (1953), විමලකීර්ති හිමි, මැද උයන්ගොඩ, පැලියගොඩ, බෞද්ධ පොත් සමාගම.
රාහුලහිමි, අත්තුඩාවේ සිරි (2005), **බෞද්ධ දර්ශනය**, දයාවංශ ජයකොඩි, කොළඹ.
බලගල්ලේ, විමල් ජී. (1994), **ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික උසස් අධ්‍යාපන ආයතන**, *පුස්තකාල ප්‍රවෘත්ති.*
රාහුල හිමි, වල්පොල (1988), **ලක්දිව බුදුසමයේ ඉතිහාසය**, ගොඩගේ, කොළඹ.
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. **මහාවංශය**, 1959, කොළඹ.
පියනන්ද, හේන පිටගෙදර (1954), **සංඝරාජ සාධු චරියාව**, ගුණසේන, කොළඹ.
පේමානන්ද හිමි, පන්නල පිටියේ (1907), **සංඝරාජ වත,**
හේවාවසම්, ප.බ.ජ. (1996), **මාතර යුගයේ සාහිත්‍යධරයන් හා නිබන්ධන**, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.
වික්‍රමසිංහ, කේ.ඩී.පී. (1961), **සිංහල ලේඛක පරපුර**, ගුණසේන, කොළඹ.
හේවාවසම්, ප.බ.ජ. (1996), **මාතර යුගයේ සාහිත්‍යධරයන් හා නිබන්ධන**, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.
වික්‍රමසිංහ, කේ.ඩී.පී. (1961), **සිංහල ලේඛක පරපුර**, ගුණසේන, කොළඹ.
පියනන්ද, හේන පිටගෙදර (1954), **සංඝරාජ සාධු චරියාව**, ගුණසේන, කොළඹ.
වීරසූරිය, පී.ඩී.එස්. (1951), **මාතර සාහිත්‍යවංශය**, කර්තෘ, වලස්මුල්ල.
හේවාවසම්, ප.බ.ජ. (1996), **මාතර යුගයේ සාහිත්‍යධරයන් හා නිබන්ධන**, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.
වික්‍රමසිංහ, කේ.ඩී.පී. (1961), **සිංහල ලේඛක පරපුර**, ගුණසේන, කොළඹ.
විමල කීර්තිහිමි, මැදඋයන්ගොඩ (1953), **මාතර සාහිත්‍ය යුගය**, බෞද්ධ පොත් සමාගම, පැලියගොඩ.